**ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගම - 2024**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගමේ ("සමාගම") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 හි 07 ඡේදය අනුව මාස 03 ක් හෝ ඊට වඩා අඩු කාලයක් සඳහා ආයෝජනය කරන ලද මුදල්, මුදල් හා මුදල් සමාන දෑ ලෙස හඳුනාගත යුතු වුවද, මාස 03ක කාලයක් සඳහා ආයෝජනය කර තිබූ රු. මිලියන 125.745ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑ යටතේ දැක්වීම වෙනුවට ස්ථාවර තැන්පතු ලෙස දක්වා තිබීම හේතුවෙන්, මුදල් හා මුදල් සමාන දෑ හා ස්ථාවර තැන්පතු එම ප්‍රමාණයෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි. | ආයෝජන කෙටිකාලීන හා දීර්ඝකාලීන ලෙස වර්ගීකරණය කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇති බවට තහවුරුකර ගැනීමෙන් පසුව මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07හි 18(ආ) ඡේදය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය තුල රු. මිලියන 0.95 ක් වූ විනිමය අලාභය මූල්‍ය නොවන ගණුදෙනු ලෙස මෙහෙයුම් ක්‍රියාකරකම් යටතේ ගැලපීම් සිදුකර නොතිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට සටහන් කරගත් බව. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 34 ඡේදය ප්‍රකාරව වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස්වන විට වර්ෂ 03 කට හෝ 05 කට වරක් ප්‍රත්‍යාගණනයක් සිදු කළ යුතු වුවත් 2013 වර්ෂයෙන් පසු රු. මිලියන 74.37 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණනය සිදුකර නොතිබුණි. | 2025 වර්ෂයේදී අදාළ ප්‍රත්‍යාගණනය සිදු කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන බව. | - එම - |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්ෂය ගණනය කිරීමේදී, එහි වත්කම් සම්බන්ධයෙන් අවශේෂ වටිනාකම හා ප්‍රයෝජනවත් ජීව කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් තවදුරටත් භාවිතයට ගනිමින් පැවති වටිනාකම රු. මිලියන 16.64 ක් වූ වාහන 5ක ඵලදායී ජීවකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට එහි ධාරණ අගය ශුන්‍ය වී තිබුණි. | මෝටර් රථ රු.මිලියන 16.64 ක් ලෙස මෝටර් රථ ප්‍රත්‍යාගණනය කර ඇත. ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය යටතේ ප්‍රත්‍යාගණනය කරන ලද මෝටර් රථ 2024 ජූලි 20 දින තෙක් ක්ෂය ගණනය කළ යුතු අතර අදාළ ආයතනයට ප්‍රත්‍යාගණනය කිරීමට ලබා දී තිබුණේ කාර්යාල උපකරණ හා ලී බඩු සවිකිරීම් පමණක් බව. | - එම - |
| (ඉ) | 2023 පෙබරවාරි මිලදී ගෙන තිබූ විදුලි ජනන යන්ත්‍රය 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණනය කිරීමේදී ප්‍රත්‍යාගණන වටිනාකම රු. මිලියන 2.5 ක් වැඩියෙන් සටහන් කිරීම හේතුවෙන් කාර්යාල උපකරණවල වටිනාකම සහ ප්‍රත්‍යාගණන අතිරික්තය රු. මිලියන 2.5 කින් වැඩියෙන් දක්වා තිබුණු අතර එම ප්‍රත්‍යාගණන අතිරික්තය සමුච්චිත ලාභයට ගලපා තිබීම හේතුවෙන් සමුච්චිත අතිරික්තය රු. මිලියන 2.5 කින් වැඩියෙන් දක්වා තිබුණි. තවද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16හි 77 වන ඡේදයේ අනුඡේද (අ) සිට (ඊ) දක්වා වූ පරිදි ප්‍රත්‍යාගණන අතිරික්තය සම්බන්ධයෙන් වූ තොරතුරු මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි වත්කම් වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කළ යුතු අතර ප්‍රමිතවලට අනුකූලව හෙළිදරව් කිරීම් සිදු කර ඇති බවට තහවුරුකර ගැනීමෙන් පසුව මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය පිළියෙල කිරීමේදී ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද පොළී ආදායම රු.මිලියන 40.09ක් ලෙස, හා ආයෝජන | 2023 වර්ෂයට අදාළ වූ එහෙත් 2024 වර්ෂයේදී ලැබී ඇති රු. මිලියන 26.35 ක් වූ පොළී ආදායම ලැබිය යුතු ගිණුම් | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කර ඇති බව මූල්‍ය ප්‍රකාශන සහතික |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී වර්ෂය තුළදී මුදලින් ලද පොළී ආදායම රු. මිලියන 51.20 ක් ලෙස ගැලපිය යුතු වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී එම අගය රු. මිලියන 24.85 ක් ලෙස දක්වා තිබුණි. | යටතේ ඇති ලැබිය යුතු පොලී ආදායම හරහා ගලපා ඇති අතර 2023 හා 2024 යන වර්ෂයන්ට අදාළව ලැබී ඇති පොළිය ලැබිය යුතු පොළී ආදායමට මේ වන විටත් ගලපා ඇති බව. | කිරීමට පෙර තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2024 දෙසැම්බර් 31 දිනට වූ ශේෂ පිරික්සුමෙහි අන්තර් සමාගම් (ජංගම) ගිණුම් ශේෂ ලෙස පැවති එකතුව රු. මිලියන 139.09 ක් වූ හර හා බැර ශේෂ වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂයන් හර හා බැර වශයෙන් එක සමාන වටිනාකම් වලින් අන්තර් සමාගම් (related parties accounts) අතර ඇති අතර ඒකාබද්ධ ශේෂ පිරික්සුම (Agency. Medical/Insurance) සෑදීමේ මෙම ශේෂයන් ශූන්‍ය අගයක් වී ඇති බැවින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් වී නොමැත. | මූල්‍ය ප්‍රකාශන සම්පූර්ණව සහ නිවැරදිව පිළියෙල කර ඇති බවට තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 අගෝස්තු 09 දින සිට 13 දින දක්වා සමාගමේ සභාපති හා සාමාන්‍යාධිකාරී විසින් රු. මිලියන 2.25 ක වියදමක් දරා පෝලන්තය බලා සංචාරය කර තිබූ අතර එමඟින් ලැබුණු රැකියා ඇණවුම සඳහා අයදුම්කරුවන් 10 දෙනෙකු වීසා ලබාගැනීම සඳහා ඒජන්සි සමාගම විසින් 2024 අප්‍රේල් 09 දින සිට දින 14 ක්ද , දෙවන වරට මැයි 14 දින සිට ජුනි 15 දින දක්වා චෙන්නායි වෙත රැගෙන ගොස් තිබුණි. නව වීසා ලබා ගැනීමේ කටයුතු සඳහා දින වෙන් කර ගැනීමට සමාගමේ කාර්යාල කාර්ය සහායකයෙකු, රියදුරු මහතුන් දෙදෙනෙකු හා තොරතුරු තාක්ෂණ සහකාර කළමනාකරුවෙකු සමාලෝචිත වර්ෂයේදී ඉන්දියාවේ නවදිල්ලි නුවර හා චෙන්නායි වෙත එකම කාර්යය සඳහා අවස්ථා තුනකදී 2024 ජනවාරි 24 දිනැති අංක 08/2024 දරන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හා සභාපතිගේ අනුමැතිය මත විදේශගතව තිබුණි. ඒ සඳහා රු. මිලියන 6.52 ක් හා ශ්‍රමිකයින් විසින් රු.මිලියන 8 ට ආසන්න මුදලක් වැයකර තිබුණද අදාළ කාර්යය ඉටුවී නොතිබුණි. තවද, සමාගමේ සභාපතිද මෙම කාලසීමාවේදී ඉන්දියාවට යාම සඳහා රාජකාරී නිවාඩු අයදුම්කර තිබූ අතර, විදේශගත වූ බවට තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. ඒ අනුව රැකියා ඇණවුම සඳහා වීසා ලබාගැනීම වෙනුවෙන් අවස්ථා දෙකකදී එකතුව රු.මිලියන 8.77 ක්ද ශ්‍රමිකයින් විසින් | පිළිතුරු ඉදිරිපත් කර නැත. | මෙම විදේශ සංචාර 03 පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදු කර ප්‍රමාණවත් දැනුම සහ හැකියාව ඇති නිලධාරීන් යොමු නොකිරීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අනුව කටයුතු කළ යුතුය. |

ආසන්න වශයෙන් රු.මිලියන 08 ක් වැයකර තිබුණද අදාළ කාර්යය ඉටු නොවීම හේතුවෙන් දරන ලද වියදම නිෂ්ඵල වී තිබුණි.මෙම සංචාර තුන සඳහා වෙන වෙනම ලිපිගොනු විධිමත් ලෙස සකස්කර නොතිබූ අතර පෝලන්ත රාජ්‍යය වෙත වීසා ලබාගැනීම ඉතා අසීරු කාර්යයක් බව දැනගෙන අත්හදා බැලීමක් ලෙස මෙය සිදු කිරීමත්, එම කාර්යය සඳහා මෙවැනි කාර්ය මණ්ඩලයක් යොමු කිරිමත් පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් ලැබිය යුතු ලෙස රු. මිලියන 7.29 ක් දක්වා තිබුණද කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු. මිලියන 3.03 ක් වූයෙන් රු. මිලියන 4.55 ක නොසැසඳීමක් පැවතුණි. | විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙතින් අදාළ තොරතුරු පරීක්ෂාකර ඉදිරි පියවර ගැනීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර අන්තර් ගිණුම් ශේෂ වල නිවැරදිතාවය තහවුරුකරගත යුතු අතර ගිණුම් හා මූලාශ්‍ර ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | දකුණු කොරියාව බලා යාම සඳහා නැවත ගෙවීමේ ගාස්තුවක් ලෙස 2006 වර්ෂයේ සිට එක් අයෙකුගෙන් රු.50,000 ක් බැගින් අයකරගෙන තිබූ මුදලින් තවදුරටත් ගෙවිය යුතු ශේෂය ලෙස එකතුව රු. මිලියන 15.27 ක් වර්ෂ 15 ක සිට පැවතුණි. | වසර 5කට වඩා වැඩි කාලයක සිට පැවතගෙන එන ලැබිය යුතු ශේෂ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව උපදෙස් පතා අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කල අතර ඒ සඳහා ලබා දෙන ලද උපදෙස් මත අදාළ ක්‍රියා මාර්ග ගනිමින් පවතින බව. | අදාළ ශ්‍රමිකයින් වෙත මුදල් කඩිනමින් ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දකුණු කොරියාවට විදේශගත කර තිබූ වෑද්දුම් ශිල්පීන්ගේ සියළු වියදම් පියවීම සඳහා 2023 පෙබරවාරි මාසයේදී එක් විගමණික ශ්‍රමිකයෙකුගෙන් රු. මිලියන 2.580 බැගින් 175 දෙනෙකුගෙන් එකතුව රු.මිලියන 451.584 ක මුදලක් අයකරගෙන වසර දෙකක් ඉක්මවා ගොස් තිබුණි. එසේ තිබියදී එම වෑද්දුම් ශිල්පීන් 77 දෙනෙකු සඳහා එක් | මෙම ගෙවීම් කිරීම සඳහා අදාළ ඉන්වොයිස් මුදල් අංශය වෙත ඉදිරිපත් කර නොමැති බව. | පරීක්ෂණයක් පවත්වා තත්‍ය වශයෙන් ගෙවිය යුතු වටිනාකම් සහ පාර්ශ්ව හඳුනාගෙන ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අයෙකු වෙනුවෙන් රු.200,000ක් බැගින් සම්බන්ධීකරණ ගාස්තු ලෙස රු.මිලියන 15.4 ක් හා කොරියානු සමාගමක් වෙත කොමිස් මුදල් ලෙස රු.මිලියන 18.83 ක් වශයෙන් මුළු එකතුව රු.මිලියන 34.23 ක් තවදුරටත් ගෙවිය යුතු වියදමක් ලෙස වසර දෙකක සිට පැවතුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය තුළ රු. මිලියන 0.62 ක් වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිටද රු. මිලියන 4.09 ක් වර්ෂ 5 ත් 10 ත් අතර කාලයක සිට පැවත එන ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | වසර 5කට වඩා වැඩි කාලයක සිට පවතින ලැබිය යුතු ශේෂ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව උපදෙස් පතා අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කල අතර ඒ සඳහා ලබා දෙන ලද උපදෙස් මත අදාළ ක්‍රියා මාර්ග ගනිමින් පවතින බව. | - එම - |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදය 7.9.6 ඡේදය | මිලදී ගැනීමට පූර්වාසන්නයේම එකී නිලධාරියාගේ කලත්‍රයාට හෝ මවට හෝ පියාට හෝ සහෝදරියකට, සහෝදරයකුට අයිතිව තිබූ හෝ ණය ඉල්ලුම් කිරීමට පූර්වාසන්නයේම අවුරුදු 06 ක කාලය තුළ නිලධාරියාට හෝ කලත්‍රයාට අයිතිය තිබූ මෝටර් රථයක් සඳහා ණය ලබාදීම නිර්දේශ නොකළ යුතු වුවද, නිලධාරීන් 4 දෙනෙකු සඳහා නිලධාරියාට හෝ කලත්‍රයාට අයිතිව තිබූ මෝටර් රථ මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී එකතුව රු. මිලියන 3.4 ක ණය මුදල් ලබාදී තිබුණි. | මෙම වාහන ණය පහසුකම ලබා දී ඇත්තේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පරිදි බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1996 ඔක්තොබර් 04 දිනැති සාංගමික සංස්ථාවලිය | (i) රජයේ පූර්ණ හිමිකාරිත්වය ඇතිව ආරම්භ කර තිබූ මෙම විදේශ රැකියා ඒජන්සි සමාගම මඟින් රජයේ සුරක්ෂිතතාවය මත සාපේක්ෂව අඩු පිරිවැයකින් සහ සීමාවකින් තොරව ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් රැකියා සඳහා යොමු කිරීමේ හැකියාව පැවතියදී 2023 හා | අප ආයතනය රාජ්‍ය අනුග්‍රහයක් ඇති ආයතනයක් බැවින් අඩුම බදවාගැනීමේ ගාස්තුවක් මත සහ විශ්වාසනීයව රැකියා සුරක්ෂිතභාවයකින් යුතුව ශ්‍රමිකයින් විදෙස්ගතකිරීමට උත්සාහ කරනු ලබන ආයතනයකි. විදේශ සේවා | අරමුණු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුවන පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සහ උපායමාර්ගික සැලසුම් |

| | | | |
|---|---|---|---|
| | 2024 වර්ෂ වලදී රැකියා ඇබෑර්තු පිළිවෙලින් 2100 ක් හා 2556ක් ලැබී තිබුණද, ලබා දී තිබූ විදේශ රැකියා ප්‍රමාණය පිළිවෙලින් 663ක් හා 560ක් පමණක් විය. ඉන් සමාගම වෙත ලැබුණු රැකියා ඇණවුම් වලින්, විදේශගත කර තිබූ සංඛ්‍යාව පිළිවෙලින් 460ක් හා 419ක් වූ අතර බාහිර පාර්ශවයන් මාර්ගයෙන් සොයාගත් රැකියා සඳහා කාර්යාංශයේ ලියාපදිංචි කර විදේශ ගත කර තිබූ සංඛ්‍යාව පිළිවෙලින් 203ක් හා 141ක් විය. ඒ අනුව ආයතනය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ ඉටුකර ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණි. | නියුක්ති කාර්යාංශය මගින් රැකියා ඇණවුමක් සඳහා අනුමැතිය ලබා දෙනු ලබන්නේ වසර 02 ක කාලයක් සඳහායි. ඒ අනුව 2023 වර්ෂයේ ලබා ගන්නා ලද ඇණවුම් 2025 වර්ෂයේ අවලංගු වන අතර 2024 වර්ෂයේදී ලබා ගන්නා ලද පළමු අනුමැතීන් 2026 වර්ෂය තෙක් වලංගු කාලයක් පවතී. ඒ අනුව ඉදිරියට අපේක්ෂකයින් විදේශ ගතකිරීමට නියමිතව ඇති බව. | සකස්කර ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය මඟින් විදේශ රැකියා අවස්ථා නංවාලීම සඳහා ජයගමු ශ්‍රී ලංකා නමින් දීපව්‍යාප්ත වැඩසටහනක් 2024 ජනවාරි සිට ජූලි දක්වා දිස්ත්‍රික්ක 24 ක් ආවරණය කරමින් පවත්වා තිබූ අතර, කාර්යාංශය විසින් රු. මිලියන 12 ක් වැය කර වැඩසටහන් 24 ටම සහභාගී වීම සඳහා විදේශ සේවා නියුක්ති ඒජන්සි සමාගමට අවස්ථාව ලබාදී තිබුණු අතර, ඊට අමතරව ඒජන්සි සමාගම විසින්ද ඒ සඳහා රු. මිලියන 1.359 ක් වැය කර තිබුණි. ඒ අනුව රු. මිලියන 13.359 ක් වැයකර ජංගම වැඩසටහන් 24 කට සහභාගි වී ලියාපදිංචි කරගෙන තිබුණද 2025 අප්‍රේල් 30 දින වන විට සමාගම මගින් 13 දෙනෙකු පමණක් විදේශගත කර තිබුණි. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අයත් රජයේ එකම විදේශ රැකියා ආයතනය වශයෙන් ජයගමු ශ්‍රී ලංකා වැඩසටහන් සඳහා අප ආයතනය සඳහා සහභාගී වූ අතර එම වැඩසටහන් මගින් ලියාපදිංචි වී සම්මුඛ පරීක්ෂණ සඳහා යොමුකොට මේ වන විට විදේශ ගත කරවන ලද බව. | උපරිම ප්‍රගතිය ලැබෙන පරිදි ව්‍යාපෘති සැලසුම්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |
| (iii) | 2018 වර්ෂයේදී සයිප්‍රස් රාජ්‍යයෙන් ලැබී තිබූ රැකියා | සයිප්‍රස් මගින් අප වෙත ලැබී ඇති රැකියා ඇණවුමට අනුව | විදේශ රැකියා නියෝජිත |

| | | | | |
|---|---|---|---|---|
| | | ඇණවුමෙහි වලංගු කාලය 2020 නොවැම්බර් 08 දින අවසන් වී තිබුණද ශ්‍රමිකයින් විසින් පෞද්ගලිකව සොයා ගන්නා ලද රැකියා සඳහා කාර්යංශයේ ඍජුවම ලියාපදිංචි කිරීම වෙනුවට අදාළ වීසා බලපත්‍රය ඒජන්සි සමාගම වෙත ගෙන්වාගෙන ශ්‍රමිකයින්ගෙන් ඒ සඳහා රු.35,000ක් පරිපාලන ගාස්තු ලෙස සමාගම අයකර කාර්යාංශයේ ලියාපදිංචිය සිදු කර තිබුණි. 2024 ඔක්තෝබර් සිට රැකියා ඇණවුම දීර්ඝ කිරීමක් සිදු කර නොතිබුණු නමුත් සයිප්‍රස් රාජ්‍යය වෙත ශ්‍රමිකයින් යොමු කිරීමට රු.35,000ක් පරිපාලන ගාස්තු ලෙස සමාගම අයකර කාර්යාංශයේ ලියාපදිංචිය ස්වයංව (Self-Registration) සිදු කිරීමට කටයුතු කරන බව තවදුරටත් නිරීක්ෂණය විය. | එරට නියෝජිත ආයතනයක් නොමැතිව නිකුත් කරනු ලබන වීසා බලපත්‍ර සඳහා ඊට අදාල අයදුම්කරුවන්ගේ රක්ෂණ කටයුතු අප ආයතනය මගින් සිදු කිරීමට විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කළමණාකරණ රැස්වීමේ තීරණයකට අනුව අප ආයතනය වෙත බලය පැවරී ඇත. මෙම රැකියා ඇණවුම හරහා විදේශගතවන ශ්‍රමිකයින් හට ඉතා සාධාරණ මුදලක් වන රු.35,000ක පරිපාලන ගාස්තුවකට යටත්ව කාර්යාංශ ලියාපදිවිය සිදුකරන අතර AL/1500/001/18 අනුමැතිය 2024 ඔක්තෝබර් සිට විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් දීර්ඝ කිරීම සිදුනොකළ බැවින් ස්වයං ලියාපදිංචිය හරහා මෙලෙස අප වෙත ලැබෙන වීසා බලපත්‍ර සඳහා අනුමැතිය ලබා ගනු ලබන බව. | ආයතනයක් ලෙස විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ එකඟ වී ඇති ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1996 සාංගමික සංස්ථාවලියේ 2017 සැප්තැම්බර් 28 දිනැති විශේෂ යෝජනා සම්මුතිය | විශේෂ සංශෝධනයන් ව්‍යවස්ථාවලියට ඇතුළත් කර 2017 වර්ෂයේ සිට වසර 06 ක් ඉක්මවා තිබුණු නමුත් ගුවන් ප්‍රවාහන සේවා බලපත්‍රය (IATA) ලබාගැනීමට හා ටිකට්පත් නිකුත් කිරීමේ ඒකකයක් ආරම්භ කිරීමට සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලයක් පත් කර ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමටත් එම ඒකකයට අවශ්‍ය නීතිමය පසුබිම සකස් කර ගැනීමටත් ඒජන්සි සමාගම විසින් 2024 දෙසැම්බර් 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි. තවද, අනුමත කාර්ය මණ්ඩලය තුල ඊට අදාල තනතුරක්ද නොපවතින බව නිරික්ෂණය විය. | මේ වන විට ගුවන් ටිකට්පත් අංශය සඳහා අප ආයතනයේ රැකියා ප්‍රවර්ධන නිලධාරිනියක් අනුයුක්ත කර ඇති අතර ඇය අදාළ සුදුසුකම් (IATA) සම්පූර්ණ කර ඇත. කාර්ය මණ්ඩලය තුළ එම තනතුර ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය පියවර මේවන විට ගනිමින් පවතින බව. | සාංගමික සංස්ථාවලියේ අරමුණු අනුව, ගුවන් ටිකට්පත් නිකුත් කිරීම් ඒකකයක් ආරම්භ කිරීමට අවශ්‍ය නීතිමය පසුබිම සකස් කර ගැනීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 145.304 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 152.085 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 6.781 කින් පිරිහීමක් නිරීක්ෂණය විය.මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් විදේශගත කිරීම සඳහා ශ්‍රමිකයින් බඳවා ගැනීමේ ආදායම් සියයට 69කින් හා ස්ථාවර තැන්පතු පොළී ආදායම් සියයට 25කින් අඩු වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) 2023 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිතව වර්ෂයේ විදේශගතවීම් සියයට 69 කින් අඩු වී තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ශ්‍රමිකයින් විදේශගත කිරීමෙන් ඉපයූ ආදායම රුපියල් මිලියන 128.96 කින් අඩුව වී තිබුණු අතර එය සමස්ථ ආදායමින් සියයට 20 ක් වී තිබුණි.

(ආ) විදේශ රැකියා ඒජන්සි සමාගම මඟින් ගුවන් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලබන අතර, 2023 වර්ෂයට සාපේක්ෂව එමඟින් ඉපයූ ආදායම රුපියල් මිලියන 111.438 කින් වර්ධනය වී රු.මිලියන 170ක් වී තිබුණි. එය සමස්ථ ආදායමින් සියයට 61 ක් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම විසින් පුද්ගලික ආයතනයක් සමඟ ඇති කරගත් ගිවිසුමකට අනුව ආරම්භ කරන ලද ඉන්සිලැබ් ආයතනය පවත්වාගෙන යෑම සඳහා කුළී පදනම මත ලබාගත් ගොඩනැගිල්ල සඳහා ගෙවා තිබුණු රු.600,000ක අත්තිකාරම් ගොඩනැගිල්ලෙන් ඉවත් වී වසර 8ක් ඉක්මවා ගොස් තිබුණද නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉන්සිලැබ් වෛද්‍ය මධ්‍යස්ථානය සඳහා කුළී පදනම මත ලබාගත් ගොඩනැගිල්ල සම්බන්ධයෙන් කොළඹ දිසා අධිකරණයේ පනවා තිබූ නඩු කටයුත්ත අවසන් වූයේ 2024 ඔක්තෝබර් 30 දින වන අතර බස්නාහිර පළාත් සිවිල් අභියාචනා මහාධිකරණයේ පනවා තිබූ නඩු කටයුත්ත අවසන් වූයේ 2024 නොවැම්බර් 20 දින වේ. ඒ අනුව මේවන විට අදාළ අත්තිකරම් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරගෙන යමින් පවතින බව. | අත්තිකරම් ලබා ගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දීර්ඝ කාලයක සිට ගනුදෙනු සිදු කිරීමකින් තොරව එකතුව රු.465,650ක් වූ ඉතිරි කිරීම් ගිණුම් 06 ක් අක්‍රීයව පවත්වාගෙන ගොස් තිබූ අතර ඉන් එකතුව රු.231,878ක් වූ බැංකු ගිණුම් 4ක් වසා දැමිය යුතු බවට 2024 ඔක්තෝබර් 29 දින | ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බව. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පරිදි අක්‍රීය බැංකු ගිණුම් වසා දැමීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණද 2024 දෙසැම්බර් 31 දින දක්වා ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | ගුවන් ටිකට්පතක් සඳහා රු.295,000 බැගින් ඊශ්‍රායල් රාජ්‍යයේ කෘෂිකාර්මික අංශය සඳහා විදේශ ගත වීමට අපේක්ෂා කරන ශ්‍රමිකයින් 191 දෙනෙකු විසින් එකතුව රු.මිලියන 56.345 ක් ඒජන්සි සමාගම වෙත 2024 පෙබරවාරි මස ගෙවීම් කර තිබුණි. නමුත් ඔවුන්ගෙන් 79 දෙනෙකු 2024 දෙසැම්බර් 29 දින ඊශ්‍රායලය බලා පිටත්ව ගොස් තිබූ අතර ටිකට්පතක මිල රු.178,200ක් පමණක් වී තිබුණි. ඒ අනුව 116,800 බැගින් 79 දෙනෙකු සඳහා රු. මිලියන 9.23 ක් 2024 දෙසැම්බර් 29 දින නැවත ශ්‍රමිකයින් වෙත ගෙවීමට සිදුවී තිබුණි. ඒ අනුව ටිකට්පතක මිල ඉතා ඉහළ අගයකට පුද්ගලික ආයතන මගින් මිලදීගෙන තිබුණි. | ගුවන් ටිකට්පතක් සඳහා රු.295,000 ක මුදලක් ලබාගෙන ඇති අතර අදාළ විගමණිකයන් ගෙන් 48 දෙනෙකු විදේශගත වි ඇත්තේ දෙසැම්බර් වේ. එබැවින් එහිදී ටිකට්පතක මිළ රු.178,200 ක් වූ බැවින් ලබාගෙන ඇති අතිරික්ත මුදල නැවත ඔවුන් වෙත ලබා දී ඇති බව. | ටිකට්පතක් මිලදී ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කල යුතුය. මේ සම්බන්ධයෙන් ජාතික විගණන පනතේ 38 (ඈ) වගන්තිය අනුව සමාලෝචනය කර ලිඛිත උපදෙස් ගණන්දීමේ නිලධාරී විසින් නිකුත්කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ඒජන්සි සමාගමේ ඉල්ලීම අනුව කාර්යාංශය විසින් 2024 ජනවාරි සිට නොවැම්බර් 13 දක්වා ඊශ්‍රායලයේ කෘෂි කාර්මික හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රැකියා සඳහා විදේශගත කරන ලද විගමණික ශ්‍රමිකයින් 6,959 දෙනෙකුගෙන් ටිකට්පතක් සඳහා මිල රු.295,000ක් ලෙස ස්ථාවර මිල ගණනක් අයකර තිබුණි. 2024 නොවැම්බර් 13 දින සිට දෙසැම්බර් 24 දින දක්වා ටිකට්පතක සාමාන්‍ය මිල රු.163,275 සිට රු.156,000 දක්වා පරාසයක් වූ බැවින් ආසන්න වශයෙන් එක් අයෙකුගෙන් රු.115,000ක් බැගින් 6,959 දෙනෙකුගෙන් රු. මිලියන 800.29 කට ආසන්න මුදලක් වැඩිපුර අයකරගෙන තිබුණි. | සියලුම මිළදී ගැනීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ පරිදි සිදුකර ඇති අතර එහිදී මුද්‍රා තබන ලද මිළ ගණන් Tender Box එක හරහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් ඉදිරියේ විවෘත කර සුදුසු සැපයුම්කරුවන් තෝරාගැනීම සිදු කරනු ලබයි. මෙහිදී ගුවන් ගමන් බලපත්‍රයක මිල තීරණය වනු ලබන්නේ ලැබී ඇති මුද්‍රා තබන ලද මිළ ගණන් අනුව බව. | මේ පිළිබඳ පරීක්ෂණයක් පවත්වා වැඩි මිලට ගුවන් ටිකට්පත් ලබාගෙන ඇත්නම් එම මුදල් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර, අදාළ සේවකයින්ට ලබා දීම හා එම නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය අනුව කටුයුතු කළ යුතුය. තවද, සාංගමික සංස්ථාවලියේ සඳහන් පරිදි ගුවන් ප්‍රවාහන සේවා බලපත්‍රය (IATA) ලබාගැනීමට හා ටිකට්පත් නිකුත් කිරීමේ ඒකකයක් ආරම්භ කිරීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | 2023 දෙසැම්බර් 05 දින ඊනෙට් සහ පීබා නැමැති ආයතන හරහා ඊශ්‍රායලයේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රැකියා ඇණවුමක් ලැබී තිබූ අතර ඒ අනුව 2023 දෙසැම්බර් | පිළිතුරු ඉදිරිපත් කර නැත. | විදෙස් රැකියා සඳහා බඳවා ගැනීම් සහ අනෙකුත් අත්‍යවශ්‍ය සේවා සිදු කර ගැනීමට |

| | | | |
|---|---|---|---|
| | 29 දින එක් ශ්‍රමිකයෙකුගෙන් රු. මිලියන 1.63 ක් අය කිරීමට කාර්යංශයේ අනුමැතිය ලබාදී තිබුණි. 2024 ජනවාරි මාසයේදී ශ්‍රමිකයින් 22 දෙනෙකු විදේශගත කිරීමට කටයුතු සූදානම් කර නවලෝක රෝහලින් වෛද්‍ය පරීක්ෂණ සිදු කර ගන්නා ලෙස සමාගම විසින් දැනුම් දීමෙන් පසු ශ්‍රමිකයෙකුගෙන් රු.36,500 බැගින් රු.803,000ක් වැය කර වෛද්‍ය පරීක්ෂණ සිදු කරගෙන තිබුණද විදේශගත කිරීම අවලංගු කර තිබුණි. එය අවලංගු කිරිමට හේතු වූ කරුණු විගණනයට ඉදිරිපත් නොවූ අතර ශ්‍රමිකයින් විසින් වැය කරන ලද මුදල් ඔවුන්ගේ ඉල්ලීම් මත 2024 ජූලි 29 දින සමාගමේ මුදලින් ගෙවීම් කර තිබීම හේතුවෙන් එම වියදම සමාගමට සිදු වූ පාඩුවක් ලෙස විගණනයේදී අනාවරණය විය. | | අදාළ ක්‍රමවේදයක් සකස් කළ යුතුය. මේ සම්බන්ධයෙන් ජාතික විගණන පනතේ 38 (ඇ) වගන්තිය අනුව සමාලෝචනය කර ලිඛිත උපදෙස් නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ඒජන්සි සමාගමට ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගමේ ගුවන් ටිකට්පත් සෘජුව මිලදී ගැනීමේ හැකියාව පවතින අතර ඒ සඳහා 2021 මාර්තු 08 දින සිට ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ රු.500,000 ක්ද ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගමේ රු.5,000,000 ක් ද වශයෙන් එකතුව රු.5,500,000 ක මුදලක් ඇප තැන්පත් වශයෙන් තබා තිබුණි. එහෙත් දකුණු කොරියාව බලා කාර්යංශය මගින් 2023 වර්ෂයේ සිට 2024 ඔක්තෝබර් දක්වාම විදේශගත කරන ලද ශ්‍රමිකයන් සඳහා පුද්ගලික ප්‍රවාහන නියෝජිතායතන මඟින් මිල ගණන් කැඳවා ඉතා ඉහළ මිළගණන් යටතේ ඒජන්සි සමාගම විසින් ටිකට්පත් මිලදී ගෙන තිබුණි. ඒ පිළිබඳව 2023 වර්ෂයේ විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී තිබුණද ඒ පිළිබද අවධානය යොමු කිරීමකින් තොරව 2024 සැප්තැම්බර් දක්වා පෙර පරිදිම ටිකට්පත් මිලදී ගැනීම සිදු කර තිබුණි. | ඉහළ කළමණාකාරීත්වයේ උපදෙස් පරිදි වර්ථමානයේ මිලදීගනු ලබන සියලුම ගුවන් ටිකට්පත් රජයේ නියෝජිත ආයතන මගින් පමණක් මිලදී ගැනීමට කටයුතු කර ඇති බව. | ටිකට්පතක් මිලදී ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතුය. මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ජාතික විගණන පනතේ 38 (ඇ) වගන්තිය අනුව සමාලෝචනය කර ලිඛිත උපදෙස් නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විදුලි වියදම් සඳහා මුදල් ගෙවීමේදී සමාගමේ නමට හැර වෙනත් පෞද්ගලික පාර්ශවයකගේ නමට ඇති බිල්පත් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.285,419 ක් ගෙවා තිබුණි. | ජල බිල්පත් නිවැරදි කර ඇති අතර, විදුලි බිල්පත් නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරගෙන යනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වවුචරය සහතික කිරීමේ නිලධාරී විසින් වවුචරය නිවැරදි හා සෑම විස්තරයක් අතින්ම සම්පූර්ණ බවට සෑහීමකට පත් වීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු. මිලියන 30.46 ක් වටිනා වවුචර් පත්‍ර 02ක් සහතික කර තිබූ අතර එම වවුචර් වලට අදාළව ලියවිලි කිසිවක් ඉදිරිපත් කර නොතිබූ අතර වවුචර්පතෙහිද කිසිදු විස්තරයක් සඳහන් කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | - එම - |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනත 40 (i) වගන්තිය ප්‍රකාරව පාලක මණ්ඩලය විසින් යථා පරිදි පත්කරනු ලබන තමාගේම අභ්‍යන්තර විගණකවරයෙකු පත්කළ යුතු වුවත් සමාගම ආරම්භ කළ 2009 වර්ෂයේ සිට වාර්තාවේ දිනය දක්වාම අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබූ අතර අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි. | විදේශ රැකියා ඒජන්සිය ආරම්භයේ සිට අභ්‍යන්තර විගණකවරයෙකු නොසිටි අතර මේ වන විට විදේශ රැකියා අමාත්‍යාංශය විසින් අභ්‍යන්තර විගණනයන් සිදු කරනු ලබයි. 19ක් පමණක් සිටින අප ආයතනය ඉතා කුඩා ඒකකයක් බැවින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමේ දුෂ්කරතාවයක් පවතින බව. | අභ්‍යන්තර විගණකවරයෙකු පත් කළ යුතුය. |

**4.2 විගණන කමිටුව**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනත 41(2)(උ) වගන්තිය පරිදි පාලක මණ්ඩලය විසින් තමාට සහායදීම පිණිස විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවීමට කටයුතු කළ යුතුය. |